*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# පළමු වාර පරීක්ෂණය 2018

**9 ශ්‍රේණිය** **පෙරදිග සංගීතය** **කාලය පැය 01 යි විනාඩි 30 යි.**

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 - 20 දක්වා අසා ඇති ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 දරු නැළවිලි ගී නාද මාලාව පාදක කරගත් වික්ටර් රත්නායක ශූරීන් ගායනා කරන ලද මව්ගුණ ගීතය කුමක් ද?

(1) අම්මා සඳකි (2) ආදරයේ උල්පත වූ

(3) දුනුකෙයියා මලක් වගේ (4) සියක් ආයු ලැබ

- ප්‍රශ්න අංක 02 , 05 දක්වා ප්‍රශ්න සඳහා පහත දී ඇති ගී පාද දෙක ඇසුරින් පිළිතුරු සපයන්න.

''කෝමල මධුර බසිනී මේ ගී සාදා පවසමු දූන්
නටමු පේළි පේළි සැදී රජිදා තුටුවන මෙන්''

02 ඉහත ගීත කොටස ඇතුලත් වන්නේ කුමන ගී වර්ගයකට ද?

(1) කෝළම් (2) නාඩගම් (3) නූර්ති (4) නව නාට්‍ය

03 ඉහත ගී පාදය ඇතුලත් නාට්‍යයේ නම කුමක් ද?

(1) වෙස්සන්තර (2) දුටුගැමුණු (3) පද්මාවතී (4) ශ්‍රී වික්‍රම

04 තාලයෙන් තොරව ගැයෙන ඉහත ගී පාදය හඳුන්වන්නේ,

(1) ස්ථායි නමිනි (2) අන්තරා නමිනි

(3) දොහොරාව නමිනි (4) උරුට්ටුව නමිනි

05 ඉහත ගී පාදය ඇතුලත් නාට්‍ය ශෛලියේ දී යොදාගනු ලබන ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය කුමක් ද?

(1) තබ්ලාව (2) මද්දලය (3) රබාන (4) උඩැක්කිය

06 රාගයක යෙදෙන ප්‍රධාන ස්වර කැටි හෙවත් රාගාංග හඳුන්වන්නේ,

(1) පල්ටා නමිනි (2) සංගති නමිනි (3) අභ්‍යාස නමිනි (4) සර්ගම් නමිනි

07 |ග ප ධ නි |සං - ධ ප |- - - - |ස රි ස - |බිලාවල් රාගයට අයත් මෙම ප්‍රස්තාරයේ තුන්වන විභාගයට අදාල ස්වර ඇතුලත් පිළිතුර කුමක් ද?

(1) ම ග රි ස (2) ම ග ම රි (3) ග - ම රි (4) ග ම රි ස

08 විෂ්ණු නාරායන් භාත්ඛණ්ඩේ පඬිතුමා විසින් හඳුන්වා දී ඇති ථාට ගණන කොපමණ ද?

(1) 03 කි. (2) 05 කි. (3) 07 කි. (4) 10 කි.

09 රාගයක ජීව ස්වරය,

(1) වාදී වේ. (2) සංවාදී වේ. (3) විවාදී වේ. (4) අනුවාදී වේ.

10 ඖඩව - සම්පූර්ණ ජාතියට අයත් රාගයක ආරෝහණයේ හා අවරෝහණයේ යෙදෙන ස්වර ගණන පිළිවෙලින්,

(1) 6 - 7 කි. (2) 5 - 6 කි. (3) 5 - 7 කි. (4) 6 - 5 කි.

11 දෑතේ ඇඟිලි යොදා ගනිමින් ගීතය සමඟ Chords වාදනය කළහැකි සුසිර වාද්‍ය භාණ්ඩය කුමක් ද?

(1) විදුලි ඕගනය (2) මෙලෝඩිකාව (3) එකෝඩියන් (4) සර්පිනාව

12 සාමාන්‍ය බොක්ස් ගිටාරයක තත් සුසර කරන අනුපිළිවෙල නිවැරදිව සඳහන් පිළිතුර තෝරන්න.

(1) EADGBE (2) ABCDEF (3) EFGA BC (4) CDEFGA

13 ගිටාරයේ උපදවාගත හැකි පහළම ස්වරය,

(1) මන්‍ද්‍ර සඩ්ජයයි. (2) මන්‍ද්‍ර ගාන්ධාරයයි.

(3) මන්‍ද්‍ර පංචමයයි. (4) මන්‍ද්‍ර ධෛවතයයි.

14 මේජර් කෝඩ් එකකට හා මයිනර් කෝඩ් එකකට අයත් ස්වර පිළිවෙලින් සඳහන් පිළිතුර කුමක් ද?

(1) ස <u>ග</u> ප , ස ග ප (2) ම <u>ධ</u> ස , ම ධ ස .

(3) ප <u>නි</u> රි , ප නි රි (4) රි ම' ධ , රි ම ධ

15 කණ්ඩායම් සංගීතය මගින් ජනප්‍රිය වූ වාග්ගේයකාර නමින් හැඳින්විය හැකි ගායකයකු වන්නේ,

(1) ජගත් වික්‍රමසිංහ (2) සංගීත් වික්‍රමසිංහ

(3) ක්ලැරන්ස් විජේවර්ධන (4) ලක්ෂ්මන් විජේසේකර

16 මිශ්‍ර මාත්‍රා කැටි සහිත රිද්ම රටාව කුමක් ද?

(1) |x x|x x|x x|x x|

(2) |x x|x x x|x x|x x x|

(3) |x x x|x x x|x x x|x x x|

(4) |x x x x|x x x x|x x x x|x x x x|

17 සිංහල කණ්ඩායම් සංගීතයේ නිර්මාතෘ ලෙස සැලකෙන්නේ,

(1) ක්ලැරන්ස් විජේවර්ධන (2) නෙවිල් ප්‍රනාන්දු

(3) ඉන්‍ද්‍රානි පෙරේරා (4) ෂෙල්ටන් ප්‍රේමරත්න

18 බිලාවල් රාගයේ ගායන සමයට අදාල වේලාව,

(1) උදේ 6 - 9 දක්වා වේ. (2) රාත්‍රී 6 - 9 දක්වා වේ.

(3) උදේ 9 - 12 දක්වා වේ. (4) රාත්‍රී 9 - 12 දක්වා වේ.

19. භූපාලි රාගයේ වර්ජිත ස්වර වන්නේ,

(1) ග , ධ (2) ම , නි (3) ධ , ග (4) ග , නි

20. බිලාවල් රාගයේ අනුවාදි ස්වර ගණන,

(1) 02 කි. (2) 03 කි. (3) 04 කි. (4) 05 කි.

# 9 ශ්‍රේණිය පෙරදිග සංගීතය - II කොටස

සැලකිය යුතුයි

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

01 (i) බිලාවල් රාගයට අයත් ස්වර සංගති දෙකක් ලියා දක්වන්න. (ල. ½ x 2 = 01)

(ii) බිලාවල් රාගයේ වාදි, සංවාදි, අනුවාදි ස්වර පිළිවෙලින් ලියන්න. (ල.03)

(iii) බිලාවල් රාගයේ මධ්‍යලය ගීතයක ස්ථායි අන්තරා කොටස් දෙක ස්වර ප්‍රස්ථාර කරන්න. (ල.06)

02 (i) මව්පිය ගුණවරුණ ඇතුලත් ජනප්‍රිය සරල ගීතයක් ස්ථායි හා අන්තරා යන කොටස් දෙකක පදමාලාව ලියා දක්වන්න. (ල.06)

(ii) ඉහත ඔබ විසින් ලියන ලද ගීතයේ පදරචනය, සංගීත අධ්‍යක්‍ෂක හා ගායකයා හෝ ගායිකාවගේ නම සඳහන් කරන්න. (ල.03)

(iii) ඉහත ඔබ විසින් ලියන ලද ගීතයේ පළමු පාදයට අයත් රිද්ම රටාව ''x'' හා ''-'' යන සංකේත මගින් ලියා දක්වන්න. (ල.01)

03 (i) ඔබ අසා ඇති නූර්ති නාට්‍ය දෙකක් නම් කරන්න. (ල.01)

(ii) නූර්ති ගී වාදනයේ දී භාවිතා වන ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩයක් හා ස්වර වාද්‍ය භාණ්ඩයක් නම් කරන්න. (ල.01)

(iii) ඔබ කැමති නූර්ති ගීයක පදමාලාව සම්පූර්ණයෙන්ම ලියා දක්වන්න. (ල.08)

04 (i) වාදි, සංවාදි, අනුවාදි, විවාදි, වර්ජිත යන ස්වර වලින් 04 ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න. (ල.04)

(ii) බිලාවල්, භූපාලි, කාෆි යන රාග තුනට අදාල මුඛ්‍යාංගයන් පිළිවෙලින් ලියන්න. (ල.06)

05 (i) යතුරු පුවරුවක ප්‍රකෘති හා විකෘති ස්වර 12 ලකුණු කරන්න. (ල.06)

(ii) C, F, G යන Chords වලින් <u>දෙකක</u> Major හා Minor Chords වලට අයත් ස්වර ලියා දක්වන්න. (ල.04)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 2 | 05 | 1 | 09 | 1 | 13 | 2 | 17 | 2 |
| 02 | 3 | 06 | 2 | 10 | 3 | 14 | 4 | 18 | 1 |
| 03 | 4 | 07 | 2 | 11 | 3 | 15 | 3 | 19 | 2 |
| 04 | 3 | 08 | 4 | 12 | 1 | 16 | 2 | 20 | 4 |

(1 x 20 = ල. 20)

## II කොටස

01 (i) බිලාවල් රාගයට අයත් ස්වර සංගති දෙකක් ලියා දැක්වීමට ලකුණු ½ බැගින් x 2 - ලකුණු 01
(ii) බිලාවල් රාගයේ වාදි, සංවාදි, අනුවාදි ස්වර දැක්වීමට - ලකුණු 03
(iii) බිලාවල් රාගයේ මධ්‍යලය ගීතය ස්ථායි කොටසට - ලකුණු 03
අන්තරා කොටසට - ලකුණු 03 (මුළු ලකුණු 10)

02 (i) මව්පිය ගුණ වරුණ ඇතුලත් සරල ගීයට ස්ථායි කොටසට - ලකුණු 03
අන්තරා කොටසට - ලකුණු 03
(ii) ගීතයේ පද රචක - ලකුණු 01
සංගීත අධ්‍යක්ෂක - ලකුණු 01
ගායක / ගායිකාවගේ නම - ලකුණු 01
(iii) රාද්ම රටා යෙදීමට - ලකුණු 01 (මුළු ලකුණු 10)

03 (i) නූර්ති නාට්‍ය 02 ක් නම් කිරීමට ලකුණු ½ බැගින් - ලකුණු 01
(ii) නූර්ති සඳහා භාවිතා වන තාලවාද්‍ය භාණ්ඩ හා ස්වර වාද්‍ය භාණ්ඩය නම් කිරීමට ලකුණු ½ බැගින් - ලකුණු 01
(iii) නූර්ති ගීයක පද මාලාව දැක්වීමට - ලකුණු 08 (මුළු ලකුණු 10)

04 (i) ස්වර වර්ග වලින් 04 ක් පිළිබඳව කෙටි සටහන් ලිවීමට - ලකුණු 04
(ii) මුඛ්‍යාංගයන් පිළිවෙලින් සඳහන් කිරීම 2 x 3 - ලකුණු 06 (මුළු ලකුණු 10)

05 (i) යතුරු පුවරුවක ස්වර 12 ලකුණු කිරීමට - ලකුණු 06
(ii) Chords වලට අයත් ස්වර ලියා දැක්වීමට - ලකුණු 04 (මුළු ලකුණු 10)